// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1654/11 - 2010 මැයි 20 වැනි බ්‍රහස්පතින්දා - 2010.05.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

1990 අංක 04 දරන දකුණු පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 2 (1) වගන්තිය හා 4 වගන්තියද, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන ) පනතේ 2 වගන්තිය සමග කියවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තියද, යටතේ කරනු ලබන නිවේදනයයි

දකුණු පළාතේ පළාත් සභාවේ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජල සම්පාදන හා ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ පළාත් පාලන විෂය භාර අමාත්‍ය ගුස්තිඥ්ඥවවූ ෂාන් විජයලාල් ද සිල්වා වන මා විසින් දකුණු පළාත් සභාවේ 1990 අංක 4 දරන පළාත් පාලන ආයතන වල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 2(2) වගන්තියෙන් සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(2) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභාපති වන හේවා ලොකුගේ ජයසිරි මහතා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් කටයුතු කිරීමේදී, 1990 අංක 4 දරන දකුණු පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) වගන්තිය සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1) වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකර ඇත්දැයි පරීක්ෂා කර බැලීම සඳහා පත්කරන ලද විශ්‍රාම ලත් අධිකරණ නිලධරයාගේ පරීක්ෂණ වාර්තාවෙන් අනාවරණය වූ කරුණු අනුව, එකී තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් 1990 අංක 4 දරන දකුණු පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) වගන්තිය සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1) වගන්තිය යටතට ගැනෙන වරදවල් සිදුකර ඇති බවට සෑහීමකට පත්වී එකී 1990 අංක 4 දරන දකුණු පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) වගන්තිය හා 4(2) වගන්තියද, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1) වගන්තිය හා 185(3) (ආ) වගන්තියද අනුව, තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභාපති වන හේවා ලොකුගේ ජයසිරි මහතා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයෙන් සහ සභික ධුරයෙන් ඉවත් කරමි.

ජී. ඩබ්. ෂාන් විජයලාල් ද සිල්වා,
මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන,
ජල සම්පාදන හා ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු
සේවා, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ පළාත් පාලන
විෂය භාර අමාත්‍ය, දකුණු පළාත.

2010 මැයි මස 19 වැනි දින.

05-38

1A - PG 001146 — 390 (2010/05)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.